**සමූපකාර අතිරික්ත අරමුදල - 2018**
**-----------------------------------------**

**මතය ව්‍යාවනය**
**------------------**

සමූපකාර අතිරික්ත අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.1 මතය ව්‍යාවනය සඳහා පදනම**
**---------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**
**-----------------------------------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.4** **මූල්‍ය ප්‍රකාශන**

**1.4.1** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.4.2** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත අංක 1 හි 21 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළත් සටහන් හා අනෙකුත් විස්තරාත්මක සටහන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වෙමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රමිත අංක 1 හි 132 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ දේපළ පිරියත හා උපකරණවල ධාරණ අගය, ක්ෂය අනුපාත, ආයෝජන හා ආයෝජන පොළී යනාදිය සම්බන්ධව මිනුම්කරණ පදනම් හෙළිදරව් කර නොතිබුණි. | දේපළ පිරියත හා උපකරණ වලට අදාලව සටහන් අංක 5 මඟින් හා විස්තරාත්මක ලේඛණය උපලේඛණ අංක 1 මඟින් ඉදිරිපත් කර ඇත. ආයෝජනවලට අදාලව සටහන් අංක 2 මඟින් හා විස්තරාත්මක උපලේඛණ අංක 2 හා 3 මඟින් ඉදිරිපත් කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රමිත අංක 3හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව ඒවා ප්‍රමාණාත්මක නම් සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.8,054,044 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පෙර වසරේ ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළී ගණනයේදී සිදු වූ දෝෂය මෙම වසරේදී නිවැරදි කර ඉදිරිපත් කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රමිත අංක 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.4,523,617 ක්වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් අරමුදල විසින් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි. ඉදිරි වසරේදී ඇස්තමේන්තුගත දෝෂ ඉවත් කර ගිණුම් සකස් කරන බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.4.3 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය අනුව 2018 දෙසැම්බර් 31 දිනට වූ සමූපකාර සක්‍රීය ණය ශේෂය මත කළ යුතු ප්‍රතිපාදනය රු.13,749,075ක් වුවද එදිනට සලසා තිබුණු ප්‍රතිපාදනය රු.14,113,755 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය රු.364,680ක් වැඩියෙන් දක්වා තිබුණි. | සමූපකාර සමිති ණය හා පොළී උපලේඛණ සටහන් කිරීමේදී හා ගිණුම් තැබීමේදී සිදු වී ඇති ප්‍රමාද දෝෂයක් නිසා මෙම වරද සිදු වී ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල සමූපකාර සමිති ණය පොළී රු.224,610 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | සමූපකාර සමිති ණය හා පොළී උපලේඛණ සටහන් කිරීමේදී හා ගිණුම් තැබීමේදී සිදු වී ඇති ප්‍රමාද දෝෂයක් නිසා මෙම වරද සිදු වී ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.4.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**1.4.5 අවිනිශ්චිත ගිණුම්**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| සමූපකාර සමිති ණය | 554,726,072 | 654,724,398 | 99.998,326 | සමූපකාර සමිති ණය ලෙජරය හා උපලේඛණයේ පවතින මෙම වෙනස දීර්ඝ කාලයක සිට පැවතඑන වෙනසකි. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| ලැබිය යුතු සමූපකාර සමිති ණය පොළී | 187,329,883 | 124,525,128 | 62,804,755 | සමූපකාර සමිති ණය ලෙජරය හා උපලේඛණයේ පවතින මෙම වෙනස දීර්ඝ කාලයක සිට පැවතඑන වෙනසකි. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**---------------------**

| විෂයය | මුදල රු. | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අවිනිශ්චිත ගිණුම් | 9,475,735 | වර්ෂ 19 | 1999 වර්ෂයේ සිට පැවත එන අගයක් වන අතර විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර එහි නිර්දේශ මත සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කර ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් කළ යුතුය. |

### 1.4.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විෂයය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ලැබිය යුතු සමුපකාර සමිති ණය | 554,726,072 | ශේෂ සනාථ කිරීම් | සමිති මඟින් ණය ශේෂයන් සනාථ කිරීමට දන්වා සිටියද ඇතැම් සමිති මඟින් ප්‍රතිචාර නොදැක්වීම නිසා ශේෂ සනාථ ලබා ගැනීමට නොහැකි වී ඇත. ඉදිරියේදී ශේෂ සනාථ ලබාගෙන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ශේෂ සනාථ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමුපකාර අරමුදලින් ලැබිය යුතු මුදල | 5,029,486 | ශේෂ සනාථ කිරීම් | | |
| (ඇ) | පොදු තැන්පත් ගිණුම | 9,961,736 | විස්තරාත්මක උපලේඛනය | පිළිතුරු සපයා නොමැත. | අදාල උපලේඛන ඉදිරිපත් කිරීමට හා ශේෂ සනාථ කිරීම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ස්ථාවර තැන්පත් ඇප ණයහිමියෝ | 58,918,112 | ණය ලිපිගොනු සහ ශේෂ සනාථ කිරීම් | | |
| (ඉ) | ඇවර ගිණුම (හර ශේෂය) | 2,620,473 | පිළියෙල කරන ලද ඇවර ගිණුමේ පිටපතක් | | |
| (ඊ) | ගෙවිය යුතු භාණ්ඩාගාර අරමුදල | 150,000 | ශේෂ තහවුරු කිරීම් සහ විස්තරාත්මක උපලේඛන | | |
| (උ) | ගෙවිය යුතු ජාතික භාරකාර අරමුදල | 3,871,256 | ශේෂ තහවුරු කිරීම් සහ විස්තරාත්මක උපලේඛන | | |

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය වෙත 1992 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලබා දී තිබූ රු.155,919,038 ක ණය මුදලින් රු.128,993,618 ක්වූ ණය ශේෂ හා ඊට අදාල රු.57,779,966 ක හිඟ පොළිය තවදුරටත් අයවිය යුතුව පැවතුණි. | එකඟ වෙමි. සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමයට අදාළ ණය ගිවිසුම් ප්‍රකාරව ගෙවන ලෙස නිරන්තරයෙන් දැන්වීම් කර ඇති අතර සංගමය කැඳවා අදාල උපදෙස් ලබා දී ඇත. | ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2011, 2012 හා 2013 වර්ෂවල සමුපකාර සමිති 6 කට ලබා දී තිබූ ණයවලින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු ණයවාරික හා පොළිය පිළිවෙලින් රු.78,620,419 ක් හා රු. 39,957,507 ක්විය. | එකඟ වෙමි. අදාල සමිති ගෙන්වා ණය ප්‍රතිලේඛණගත කර සමිතිවලට ගෙවීමට පවතින හැකියාවන් පදනම් කරගෙන කොටස් වශයෙන් අය කර ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විවිධ වත්කම් යටතේ දක්වා තිබුණු 1999 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.1,721,566 ක්වූ අගරු චෙක්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 1999 වර්ෂයේ සිට පැවත එන අගයක් වන අතර විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර එහි නිර්දේශ මත සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | අගරු චෙක්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 1989 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුළ සමුපකාර සමිති 70 කට ලබාදී තිබුණු ණය මුදලින් වර්ෂය ආරම්භයේ පැවති රු.90,910,718 ක්වූ අයවිය යුතු ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන තිබුණේ රු.736,536 ක් පමණි. | ණය ප්‍රතිලේඛණගත කිරීම සඳහා පත් කර තිබෙන කමිටුව වෙත යොමු කර ඇති අතර ඉදිරියේදී ණය අය කර ගන්නා බව දන්වමි. | ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශේෂ පත්‍රයේ විවිධ වගකීම් යටතේ දක්වා තිබූ අතිරික්ත අරමුදලට ගෙවිය යුතු රු.6,017,551 ක්වූ වර්ෂ 30 කට වඩා පැරණි ශේෂය හා එකතුව රු.7,299,745 ක්වූ තවත් වගකීම් ගිණුම් 05 ක වර්ෂ 05 කට වඩා පැරණි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට ප්‍රමාණවත් සාක්ෂි හඳුනා නොගැනීම නිසා ශේෂයන් නිරවුල් කර නොමැත. ඉදිරියේදී මෙම ගිණුම් නිවැරදි කිරීමට කමිටුවක් පත් කර ඇත. | ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 188 (2) | 2013 හා 2014 වර්ෂයන්ට අදාල එකතුව රු.106,093 ක්වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි. කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.169,817,707 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.206,780,520 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.36,962,813 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ආයතන හා පරිපාලන වියදම් රු.5,573,023 කින් අඩු වුවද, පොළී ආදායම රු.41,552,368 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමූපකාර සමිති වෙත ලබා දී තිබුණු ණය මුදල් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් කටයුතු සිදුකිරීම දුර්වල මට්ටමක පැවතුනි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති එකතුව රු.610,551,550 ක්වූ ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ අයවී තිබුණේ රු.10,558,119 ක් පමණක් වූ අතර, එය ආරම්භයේ පැවති ශේෂයෙන් සියයට 1.72 ක් පමණක් විය. | එකඟ වෙමි. ණය අය කර ගැනීම හා පසු විපරම් කටයුතු සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | සමූපකාර සමිති වෙත ලබා දී තිබුණු ණය මුදල් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදුකිරීම හා ණය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2009 ලියාපදිංචි අවලංගු කර තිබුණු මානව සම්පත් සමූපකාර සමිතිය ඈවර කිරීමේ විවිධ වියදම් සහ තැන්පතු නිදහස් කිරීම වෙනුවෙන් 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අරමුදල විසින් වැයකරන ලද රු.56,901,825 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. සමිතිය ඈවර කිරීමේ කටයුතු විගණිත දිනය වන විටත් අවසන්ව නොතිබූ බැවින්, ලැබිය යුතු ශේෂය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | එකඟ වෙමි. ඈවර තීරණය අනුව ලිපිගොනු බොහොමයක් වසා දමා තිබෙන අතර ක්‍රියාකාරී ලිපිගොනු වලින් වාරික වශයෙන් ණය අය වෙමින් පවතී. | සමිතිය ඈවර කිරීමේ කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙත 2013 වර්ෂයේදී ලබා දී තිබුණු රු.75,000,000 ණය මුදලින් 2018 දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂය රු.62,091,327 ක් හා ණය පොළිය රු.35,762,355 ක් අයවීමට තිබුණි. ගිවිසුම ප්‍රකාරව, ණය අය කර ගැනීමේ කාලය ඉක්මවා තිබුණද, වත්කම් උපලබ්ධිකර ණය අයකර ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි. | සංස්ථාව වෙත ලබාදුන් ණය මුදල අයකර ගැනීම සඳහා ලිඛිතව දැනුවත් කර ඇත. ණය නොගෙවන්නේ නම් නීති මඟින් කටයුතු කර ණය මුදල අයකර ගැනීමට කටයුතු කරමි. | ගිවිසුම ප්‍රකාරව ණය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ බැංකු ජංගම ගිණුමේ සෑම මසකම අවසානයේ රු.මිලියන 3 කට වැඩි ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණු අතර දෙසැම්බර් 31 දිනට ශේෂය රු.48,449,063 ක් විය. ඒ අනුව මාසික වියදම් අවශ්‍යතාවය පුරෝකථනය කර අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මාසික වියදම් පුරෝකථනය කර අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර ඇති අතර දෙසැම්බර් 31 දිනට පැවති ශේෂයෙන් රු. මිලියන 45 ක් 2019 ජනවාරි මුල් සතියේ ආයෝජනය කිරීමට කටයුතු කර ඇත. | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |